කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය
මැයි 2025
INFORMATION



# අපගේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව!





**විදුහල්පතිතුමාගේ පණිවිඩය**

**අයිවෝ පූබාලන්, PhD**
විදුහල්පති

එදා මෙදා තුර උන් වහන්සේගේ අනුගාමිකයින්ගේ මුවඅග රැඳී තිබුණු, යේසුස් වහන්සේ තම ගෝලයන්ට ඉගැන්වූ යාච්ඤාව, සුන්දර, සරල මෙන්ම අතිශයින් ගැඹුරු යාච්ඤාවකි. එය කුඩා දරුවෙකුට වුවත් කට පාඩම් කළ හැකි, සෑම වචනයක්ම තේරුමක් ඇතුව භාවිත කළ හැකි යාච්ඤාවකි. ඒ අතරම අප තවම මෙම අද්විතීය යාච්ඤාවේ ගැඹුර සම්පූර්ණයෙන් උකහාගෙන නැතැයි, ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව අධ්‍යයනය කළ විශාරදයින්ට ඒත්තු ගොස් ඇත.

ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව පහසුවෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. පළමු කොටස දෙවියන් වහන්සේගේ වැදගත් ගුණාංග මුල් කරගෙන, උන් වහන්සේ කවුරුන්ද යන්න කෙරෙහි අවධානය යොමු කරයි: උන් වහන්සේගේ පීතෘත්වය, උන් වහන්සේගේ ශුද්ධකම සහ උන් වහන්සේගේ සර්වබලධාරිත්වය (මතෙව් 6:9-10). දෙවැනි කොටසින්, යේසුස් වහන්සේගේ අනුගාමිකයින්, දෙවියන් වහන්සේ කෙරෙහි වැඩියෙන්ම යැපෙන දේවල් කෙරෙහි අවධානය යොමු කරයි: දිව්‍ය සැපයීම, දිව්‍ය සමාව සහ දිව්‍ය ආරක්ෂාව (මතෙව් 6:11-13). මේ කොටස් දෙක යේසුස් වහන්සේ අපූරු ලෙස ගළපා ඇත. අපගේ දෛනික අවශ්‍යතා උන් වහන්සේ විසින් සපයනු ඇතැයි අප බලාපොරොත්තු වන්නේ දෙවියන් වහන්සේ අපගේ පියාණන් වන බැවිනි. අප පාපය පිළිබඳව උන් වහන්සේට ගණන් දිය යුතු අතර උන් වහන්සේගේ සමාව ඉල්ලා සිටිය යුත්තේ, උන් වහන්සේ ශුද්ධ බැවිනි. අපටම දමනය කළ නොහැකි පෙළඹවීම් වලින් අපව ආරක්ෂා කරගෙන, නපුරාගෙන් අපව මුදා ගනු ඇතැයි අප බලාපොරොත්තු වන්නේ උන් වහන්සේ සර්වබලධාරී නිසාවෙනි.

"අපගේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව" යන ඉල්ලීමෙන් යාච්ඤාවේ ඇති බහු අදාළත්වයන් පෙන්වා දෙයි: පළමුව, අපගේ ඉල්ලීම් කෙලින්ම උන් වහන්සේට ඉදිරිපත් කරන්නට අපට හැකියාව ඇත්තේ, අපගේ පියාණන් ලෙස, දෙවියන් වහන්සේට ළඟාවීමේ හැකියාව අපට ඇති බැවිනි. පොළොවේ පියවරුන්ගේ ස්වභාවික ප්‍රේමණීය ප්‍රතිචාරය තුළින්, ඊට වඩා මොන තරම් කැමැත්තෙන් හා ත්‍යාගශීලීව දෙවියන් වහන්සේ තම දරුවන් වෙනුවෙන් කටයුතු කරනු ඇත්ද යන්න, මතෙව් 7:7-11 හි යේසුස් වහන්සේ පෙන්වා දෙන සේක. යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේට "මාගේ පියාණෙනි" යයි ආමන්ත්‍රණය කිරීම විශේෂත්වයකි. ඒ හරහා, උන් වහන්සේ තුළින්, අපටද දෙවියන් වහන්සේව "අපගේ පියාණන් වහන්සේ" ලෙස අත්දැකීමේ සුවිශේෂී වරප්‍රසාදය හිමිවී ඇත. මේ නිසා, "එබැවින් අපේ අවශ්‍යතාවන්හි දී අපේ සරණ සඳහා දයානුකම්පාව ලබන පිණිස බිය සැක නැති ව කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු," යයි පැවසීමට හෙබ්‍රෙව් හසුනේ කතෘවරයාට හැකිවිය (4:16).

දෙවනුව, එම ඉල්ලීම පටු පුද්ගලවාදී ඉල්ලීමක් නොවේය: යාච්ඤාව සාමූහික පැතිකඩක් දිගටම රඳවා ගනී - "අපගේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව." පුද්ගල අවශ්‍යතා සහ මනාපයන් වර්ණනා කිරීම, ගෝලීයකරණය වූ අපගේ සංස්කෘතියේ එක් ලක්ෂණයකි. නිෂ්පාදකයින් මෙන්ම සේවා සපයන්නන්ද, ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ මාධ්‍යයක් ලෙස නිතරම ආත්මාර්ථකාමීත්වයට අනුබල දෙති. මේ නිසා, දෙවියන් වහන්සේ මගේ පටු, ආත්මාර්ථකාමී අවශ්‍යතා සපුරාලන සේවා දායකයෙකු ලෙස ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කිරීම පුදුමයට කරුණක් නොවේ. එසේ වුවද, මිනිසා නිතැතින්ම සාමූහික ජීවීන් බැවින්, අපගේ සාමූහික අවශ්‍යතාවයන් ගැන සංවේදීව යාච්ඤා කරන ලෙස යේසුස් වහන්සේ අපට උගන්වන සේක.

තුන්වනුව, අපගේ වර්තමාන අවශ්‍යතාවයන් දෙවියන් වහන්සේ වෙතට ගෙන එන මෙන් උන් වහන්සේ අපව දිරිගන්වන සේක: "අපගේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව." කිතුනුවන්, "පමණට වඩා ස්වර්ගීය මානසිකත්වයක් ඇතුව සිටීමෙන් පොළොවට අවැඩදායක වී ඇත" යන විවේචනයට ඇතැම්විට ලක් ව ඇත. යේසුස් වහන්සේ අපගේ අනාගත බලාපොරොත්තුව ගැනත්, ස්වර්ගයේ වස්තුව රැස් කිරීම ගැනත් ඉගැන්වුවද, භෞමික යථාර්ථයන් වල පැවතුන සේක. දුප්පතුන්ගේ, පීඩිතයන්ගේ සහ දුර්වලයන්ගේ වර්තමාන අවශ්‍යතාවයන් තම න්‍යාය පත්‍රයේ ඉහළින්ම ඇති බව යේසුස් වහන්සේ තම ප්‍රසිද්ධ සේවා කාලය අතරතුර, පෙන්වා දුන් සේක. ඒ අනුව, එවැනි අවශ්‍යතා දුටු විගස උන් වහන්සේ ඒවාට ප්‍රතිචාර දැක්වූ සේක. අප නමස්කාර කරන්නේ අපගේ වර්තමාන අවශ්‍යතා ගැන ගැඹුරින් සැලකිලිමත් වන දෙවි කෙනෙක්ය යන සිතිවිල්ල අපට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන අතරම, මේ ලෝකය තුළ උන් වහන්සේව අනුකරණය කරමින් ක්‍රියා කිරීමටත් අපව පොළඹවනු ඇත.

හතරවනුව, මේ ඉල්ලුමෙන්, අපගේ නෙත ගැටෙන සෑම දෙයක්ම සපයන මෙන් උන් වහන්සේගෙන් ඉල්ලා සිටීමට නොව, අපගේ පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය දේ පමණක් ඉල්ලීමට අනුබල දෙයි: "අපගේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව." යේසුස් වහන්සේගේ කාලයේදී ප්‍රාථමික අවශ්‍යතාවයන් ලෙස සැලකුණේ රොටි සහ වතුර ය. යේසුස් වහන්සේ එය වඩාත් පැහැදිලි කළ සේක: "දවස්පතා භෝජනය," නැතහොත්, "පැවැත්මට අවශ්‍ය රොටි" ලෙසද එය පරිවර්තනය කළ හැකිය. මේ සඳහා බයිබලයෙන් ගත හැකි සමීපතම ප්‍රකාශනය වන්නේ දෙවියන් වහන්සේ වසර හතළිහක් ඉශ්‍රායෙල්වරුන් කාන්තාරයේ ගමන් කරද්දී, ඔවුන්ට සැපයූ මන්නා ය. එය ඔවුන්ගේ මූලික අවශ්‍යතාවය වූ අතර, ඔවුන්ගේ පැවැත්ම සඳහා මුළුමනින්ම ප්‍රමාණවත් විය.

මේ අනුව, ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව වර්තමාන සඵලත්වයේ ඉගැන්වීම් වලට සහය නොදක්වයි. 'භෞමික ධනය සැබෑ ආත්මිකත්වය සහ දෙවියන් වහන්සේ සමඟ සමීපත්වයට සෘජුවම සමානුපාතිකයි'යි එහි අත්‍යන්ත ආකෘතිය පෙන්වා දෙයි. ඊට පටහැනිව, මිනිස් කෑදරකම අනුමත නොකරන, අපගේ මූලික භෞතික අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීමට නැඹුරු වන දෙවි කෙනෙක් අපට පෙන්වා දෙයි.

පලස්තීන සමාජයේ යේසුස් වහන්සේ ජීවත් වූ කාලයේදී, අතිශයින් පොහොසත් මනුෂ්‍යයින් සිටියද, බහුතරයක් දුප්පතුන් විය. වර්තමාන සමාජ වලද මෙවැනි අන්ත විෂමතාවයන් දැකිය හැකිය. බිලියන 1.6ක ජනගහණයකින් යුත්, දකුණු ආසියාවේ මිලියන 500ක් පමණ ජීවත් වන්නේ දිනකට ඩොලර් 1ක මුදලකිනි. ඒ අතර, ලෝකයේ මිල අධිකම නිවස පිහිටා තිබෙන්නේ, මුම්බායි නගරයේ උස් ගොඩනැගිල්ලකය. එය ඉදි කිරීමේදී එහි දකුණු ආසියානු හිමිකරුට වැය වී ඇත්තේ ඩොලර් බිලියනයකට වඩා වැඩි මුදලක් බවට ගණන් බලා ඇත!

"අපගේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව" යයි අපි යාච්ඤා කරද්දී, අප ජීවත් වන ලෝකය ගැන දැනුවත් ව සිටීම වැදගත්ය.

# ඉගෙන ගැනීමේ ප්‍රජාවක් පෝෂණය කිරීම

## චිත්තවේගී ප්‍රකම්පනයේ තුවාල සුව කිරීම

### සභාවට උපකාර විය හැකි ආකාරය



පෙබරවාරි-මාර්තු තුළ දින 4ක්

මෙම කෙටිකාලීන පාඨමාලාව මෙහෙයවන ලද්දේ, පාඨමාලා නායිකා: උපදේශනය දිලිනි ඒබ්‍රහම් විසිනි. ඇය ඇමෙරිකානු බයිබල් සංගමයේ චිත්තවේගී ප්‍රකම්පන සුවකිරීමේ ආයතනයේ සහතික ලත් ප්‍රධාන සම්පත් දායිකාවකි. මෙම පාඨමාලාව කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි උපදේශන ක්ෂේත්‍රය් කොටසක් වන අතර දුක්විඳීම, ලිංගික අපයෝජනය, දොම්නස, සහ අද අපගේ සභාවේ සහ සමාජයේ පවතින වෙනත් බොහෝ ගැටලු සම්බන්ධයෙන් අන්තර් ක්‍රියාකාරී සැසිවාර අඩංගු වෙයි.

## පුස්තකාල කළමනාකරණය

### කාර්ය මණ්ඩල සංවර්ධනය



පෙබරවාරි 27

පුස්තකාල කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණුවකට ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල සම්බන්ධීකාරකවරු සහභාගී වූහ. එය කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රධාන කාර්යාලයේ සහ උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබූ අතර මෙහෙයවන ලද්දේ සහකාර පුස්තකාලයාධිපතිවරුන් වන විරාජ් ස්ටීවන් (වමේ) සහ වනජා රාජ්කුමාර් (දකුණේ) විසිනි.

## ළමා සේවා ශිෂ්‍යයන් සඳහා ශ්‍රද්ධානකාන්තිය




මාර්තු 6-7

ළමා සේවා ක්ෂේත්‍ර වැඩසටහනේ (අන්තර්ජාලය හරහා) දෙවන ශිෂ්‍ය කණ්ඩායම සුබෝධි සමෝධානික අධ්‍යාපන මධ්‍යස්ථානයේදී පවත්වන ලද ශ්‍රද්ධානකාන්තියක් සමඟින් ඔවුන්ගේ පාඨමාලව අවසානයකට ගෙනෙනු ලැබිණි.

## ඇදහිල්ල ක්‍රියාවේදී යෙදවීම

### විශේෂ සම්මන්ත්‍රණය



පෙබරවාරි 14

ඇදහිල්ල සහ රැකියාව ඒකාබද්ධ කරමින් රැකියා ස්ථානයේ සහ ව්‍යාපාරික වෘත්තිකයන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උදෙසා ඵලදායී සාක්ෂිකරුවන් වන ආකාරය පිළිබඳව ආමන්ත්‍රණය කෙරුණු විශේෂ සම්මන්ත්‍රණයක් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගුරු මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය සඳහා පැවැත්විණි. කථිකයා වූයේ වසර තිහකට වඩා ව්‍යාපාරික ලෝකයේ ප්‍රවීණයකු වූ පෝල් බාලසුන්දරම් මහතාය.

## දේවධර්ම අධ්‍යාපනය පරිවර්තනය (2 කොටස)

### ගුරු මණ්ඩල සංවර්ධනය



මාර්තු 10-11

*Transforming Theological Education* හි කර්තෘවරයා වන ආචාර්ය පෙරී ෂෝ විසින් පවත්වන ලද ගුරු මණ්ඩල පුහුණුවකට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ගුරු මණ්ඩලය සහභාගී විය. මෙම පුහුණුව වැඩිහිටි අධ්‍යාපනයේ විවිධ අංග විස්තර කළ අතර "දේවධර්ම අධ්‍යාපනය පරිවර්තනීය" පිළිබඳව පසුගිය වසරේ පැවැත්වුණු සම්මන්ත්‍රණයේ පසුවිපරමක් විය.

# සමුගැනීම සහ ඇගැයීම
# දේවගැති ආචාර්ය ටෙඩ් සහ රෙනාටේ රුබෙෂ්

දේවගැති ආචාර්ය ටෙඩ් සහ රෙනාටේ රුබෙෂ් ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ මෙහෙවර නිමා කොට ඇමෙරිකා එක්සත් ජනපදය කරා යන අතර ඔවුන් වෙනුවෙන් ඇගැයීමේ සහ සමුගැනීමේ සැඳෑවක් මාර්තු 21 වන දින පැවැත්විණි. ආචාර්ය ටෙඩ් 1997 සිට විශ්වාසවන්තව, අව් වැසි නොතකා සෑම සතියකම ඉගැන්වීම වෙනුවෙන් මහනුවර සිට කොහුවල වෙත ළඟා වීම සඳහා බස් රථයෙන් හෝ දුම්රියෙන් ගමන් කළේය. රෙනාටේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි උපදේශන පාඨමාලාවේ ශිෂ්‍යාවකි. සිය කථිකාචාර්ය භූමිකාවට අමතරව, ආචාර්ය ටෙඩ් ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපතිවරයා ලෙස ද *Homosexuality: A Christan Perspective and Response,* (සමලිංගිකත්වය: කිතුනු දැක්ම හා ප්‍රතිචාරය) හි සම-කර්තෘවරයෙක් ලෙස ද කටයුතු කළේය. එසේම කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි සිසුන් සහ බොහෝ ආදි ශිෂ්‍යයන් මිත්‍රෝපදේශනයෙහි මෙහෙය වූ අතර එතුමා රෙනේට් සමඟ එක්ව විවාහයට සූදානම් වන සහ විවාහ ජීවිතයේ අසීරුකම් තුළින් ගමන් කරන බොහෝ යුවළවලට උපදේශන ලබා දුන්නේය. ආචාර්ය ටෙඩ් සහ රෙනාටේ ඔවුන්ගේ වසර හතළිහකට අධික කාලයක් කළ සේවය තුළින් ශ්‍රී ලංකාවේ ඔවුන් තබා යන කිතුනු ප්‍රේමයේ දායාදය පැහැදිලිව මෙම උත්සවයේ දෝරේ ගලන්නට විය. ඔවුන් නව පරිච්ඡේදයකට පා තබන අතර අපි ඔවුන්ට සියලු ආශීර්වාද ප්‍රාර්ථනා කරන්නෙමු. ඔවුන්ගේ වෙන්ව යෑම අපට දැඩිව දැනෙනු ඇත.















## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ක්‍රියාන්විතය


### ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය
### ලජ්ජාවට නැඹුරු වූ සංස්කෘතියක් තුළ අන්තර්පුද්ගල ගැටුම්වල සංකීර්ණතා

මාර්තු 11: මෙම සම්මන්ත්‍රණයේ දේශිකාව වූයේ ආචාර්ය මනෝ ඉමෑනුවෙල්ය (ශාස්ත්‍රීය ප්‍රවර්ධන අංශාධිපති). මාතෘකාව වූයේ ලජ්ජාවට නැඹුරු වූ සංස්කෘතියක් තුළ ජීවත්වන කිතුනුවන් අන්තර්පුද්ගල සමගි කිරීම පිළිබඳ ඇගේ ආචාර්ය උපාධි පර්යේෂණය මත පදනම් විය.

ආචාර්ය මනෝගේ සාමය පිළිබඳ අධ්‍යයන සඳහා වන ආචාර්ය උපාධිය පිරිනමා ඇත්තේ පිලිපීනයේ ආසියානු දේවධර්ම විද්‍යාලය *(AGSL)* විසින් වන අතර පසුව ඇගේ උපාධි නිබන්ධනය එක්සත් රාජධානියේ ලැංග්හැම් ඇකඩමික් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන්හි සභාපතිවරයා වන ආචාර්ය ක්‍රිසෝ හැන්ඩි ද සාමය පිළිබඳ අධ්‍යයන සඳහා වන ආචාර්ය උපාධියක් පිලිපීනයේ ආසියානු දේවධර්ම විද්‍යාලයෙන් *(AGSL)* ලබා ගෙන ඇති අතර හැඳින්වීමේ අදහස් ඉදිරිපත් කළේය. ආචාර්ය මනෝගේ ඉදිරිපත් කිරීම පිළිබඳ උද්යෝගී සාකච්ඡාව ආචාර්ය පෙරී ෂෝගේ විධිමත් ප්‍රතිචාරයකින් නිමාවට පත් විය.








## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි නව කුලාචාර්යවරයා

### ආත්මික හැඩගැස්වීම



කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා වන ගෞරව සම්මානනීය ඩිලෝරාජ් කනගසබේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි වර්තමාන කුලාචාර්යවරයා ලෙස සේවය කරයි. මෙය කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ආත්මික හැඩගැස්වීමේ වැඩසටහනේ මූල පිරිමිවලින් එකකි.

## සුබ පැතුම්!



වනජා රාජ්කුමාර් (පූර්ණ කාලීන ගුරු මණ්ඩල සාමාජිකා) මාර්තු 21 වන දින යාපනය විශ්ව විද්‍යාලයෙන් ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගත්තාය.
ඇයගේ උපාධි නිබන්ධනයේ මාතෘකාව වූයේ "කොළඹ 13 රජයේ නිවාසවල ජීවත් වන කිතුනු පවුල්වල ජීවිකාව යන්නය: 2021 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය තුළ රෝමානු කතෝලික සභාවේ දායකත්වය පිළිබඳ විමසුමකි." එසේම වනජා උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක ලෙස ද සහකාර පුස්තකාලයාධිපතිනිය ලෙස ද සේවය කරන්නීය. වනජා කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි දේවධර්ම උපාධිධාරී ආදි ශිෂ්‍යාවකි.

## ගෝලීය සම්මේලනවලට සහභාගී වූ ගුරු මණ්ඩලයේ සාමාජිකයන්



ජනවාරි මාසයේ තායිලන්තයේ චියැංග්මායිහිදී පැවති *Theo Global South Asian Symposium* 2025 සම්මේලනයට ආචාර්ය අයිවෝ පුබාලන් සහ රවීන් කල්දේරා (ශාස්ත්‍රීය පීඨාධිපති) සහභාගී වූහ. එහි තේමාව වූයේ "මැවිල්ලේ ඔටුන්න: මනුෂ්‍ය වර්ගයා, දෙවියන් වහන්සේගේ ස්වරූපය, සහ පාපයට වැටීම" යන්නය.

The Institute

Mesa Global

මාර්තු/අප්‍රේල් ශ්‍රී ලංකාවේ මහනුවරදී පවත්වන ලද *MESA Global's Institute for Excellence in Leadership Development* (නායකත්ව සංවර්ධනයේ විශිෂ්ටත්වය සඳහා ගෝලීය ආයතනය) වැඩමුළුවට ආචාර්ය අයිවෝ පුබාලන්, ජූලියන් දේවදාසන් (සහකාර ශාස්ත්‍රීය පීඨාධිපති), සහ ඊන්ස්ටීන් ප්‍රනාන්දු (සම සම්බන්ධීකාරක, ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන) සහභාගී වූහ.

### අඛණ්ඩ දීමනාවක් තුළින් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙත උපකාර කිරීමට ඔබ යාච්ඤා පූර්වකව සලකා බලන්නේ ද?

**1 බැංකු ප්‍රේෂණ සහ විදේශ මුදල් යැවීම (ඇ.ඩො. සහ කැ.ඩො)**

වැඩි විස්තර සඳහා අප අමතන්න

**2 ණයවර පත (ක්‍රෙඩිට් කාඩ්)**

**CTS වෙබ් අඩවිය හරහා ගෙවීම් කරන්නට**

WWW.CTS.LK වෙත පිවිසෙන්න
|
පිටුවේ ඉහළ දකුණේ තිබෙන 'GIVE TO CTS' බොත්තම ඔබන්න
|
පරිත්‍යාග කරන්න

**3 චෙක්පත්**

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ **නමට ලියන්න** (ගෙවීම් ලබන්නා) විදුහල්පති, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, 189, දුටුගැමුණු වීදිය, කොහුවල, ශ්‍රී ලංකාව **වෙත එවන්න**

**4 මුදල් ගෙවීම්**

කොහුවල කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය මූලස්ථානය වෙත පිවිසෙන්න

වැඩි විස්තර සඳහා සම්පත් සංවර්ධන කළමනාකාර, රොෂෙල් හේකල්-රණසිංහ අමතන්න
+94 77 350 2930 | rochelle@cts.lk

ඔබ වැනි ත්‍යාගශීලී මිතුරන්ගේ උපකාර නිසා කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ නව විශිෂ්ට මානයන් කරා ළඟා වෙමින් සිටී! ඔබගේ දීමනාව මගින් දෙවියන් වහන්සේගේ රාජ්‍යය සඳහා විශිෂ්ටතම සේවකයන් පුහුණු කිරීම කෙරෙහි වෙනසක් ඇති කළ හැකිය.